29-03-2018

ද මැසිනොද් විදුහල කඳාන

# De Mazenod College - Kandana

## ඉතිහාසය -I

පැය 3

දෙවන වාර පරීක්ෂණය 2018 මාර්තු

13 ශ්‍රේණිය

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවරහෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.

(1) 1 තිඹිරිවැව ලිපිය 2. හැබැස්ස ලිපිය 3. අඹගමුව ලිපිය
4. කුසලානකන්ද ලිපිය 5. ටැම්ගොඩ විහාර ලිපිය

(2) 1. ගාල්ල 2. ගන්නෝරුව 3. කල්පිටිය
4. යාපනය 5. මෝදර

(3) 1. මධ්‍ය දේශය 2. අටදහස්රට 3. මලයරට
4.පසේයාදුන් රට 5. දොළොස්දහස් රට

(4) 1. ලම්බකර්ණ 2. මෝරිය 3. පල්ලව
4. කාලිංග 5. මානවම්ම

(5) 1. රත්නාවලී 2. ලීලාවතී 3. සීවලී
4. කල්‍යාණවතී 5. අනුලා

(6) 1. කවුඩුලු 2.හුරුළු 3.කනදරා
4. මහගල්කඩවර 5. යෝධවැව

(7) 1. ජයවීර බණ්ඩාර 2. නිකපිටියේ බණ්ඩාර 3. විදියබණ්ඩාර
4. වීරසුන්දර බණ්ඩාර 5. යමසිංහ බණ්ඩාර

(8) 1. අසවේදු 2.ඇල්බගේරියා 3. ඇල්බියුකර්ක්
4. පිලිප් ද ඔලිවේරා 5. ජෝන් ෆයිබස්

(9) 1. කපිසීස 2. ජගතිපාල 3. පරාක්‍රම පාණ්ඩ්‍ය
4. ලෝකේශ්වර 5. කේශධාතු කාශ්‍යප

(10) 1.පූජාවලිය 2.කව්සිළුමිණ 3.සසදාවත
4. එළුඅත්තනගලු වංසය 5. සිදත් සඟරාව

නොගැළපෙන යුගලය තෝරා එහි අංකය සඳහන් කරන්න

(11) 1. වන නදී- යෝධ වැව 2. කදම්බ නදී- මහකනදරාව
3. මහා නදී - පරාක්‍රම සමුද්‍රය 4. ජජ්ජර නදී- මාගල්ල වැව
5. ගෝණ නදී- කලා වැව

(12) 1. කාවන්තිස්ස - දුටුගැමුණු 2. ජෙට්ඨතිස්ස - මහසෙන්
3. ධාතුසේන - කාශ්‍යප 4.මුටසිව- දේවානම්පියතිස්ස
5. තුන් වන විජයබාහු - දෙවන පරාක්‍රමබාහු

Learning Resource Centre R De Mazenod College Kandana

(13) 1. පළවන රාජේන්ද්‍ර - 1017 2. කාලිංග මාඝ - 1215
3. චන්ද්‍රබානු - 1247 4. චෙං හෝ - 1521
5. පළවන රාජ රාජ - 993

(14) 1. සපුමල් කුමරා- හත් වන බුවනෙකබාහු 2. කන්නසාමි - ශ්‍රී වික්‍රම රාජසිංහ
3. ඔස්ත්‍රියාවේ දොන් ජුවන් 4. ටිකිරි බණ්ඩාර - දෙවන රාජසිංහ
5. දොන් පිලිප් - යමසිංහ බණ්ඩාර

(15) 1. අභය වාපි - බසවක්කුලම 2. කාණ්ඩු වාපි - මහකනදරාව
3. මණිහිරවාපි - මින්නේරිය 4. පත්තපාෂාණ වාපි - පදවිය
5. හුරුල්ල වාපි - හුරුළු වැව

X හා Y තීරු නිවැරදිව ගැළපා ඇති පිළිතුර තෝරා වරහන තුළ සටහන් කරන්න

(16)

| X | Y |
|---|---|
| ඩිමුන්ඩෝ | A ක්වේරෝස් |
| කොස්මස් | B ඇරිස්ටෝටල් |
| පාඕ වාං | C රොබට් නොක්ස් |
| එදා හෙළදිව | D පි-වියු-නි-චුවාං |
| ලංකාධිපත්‍යය | E ටොපොග්‍රැපියා ක්‍රිස්ටියානා |

1. BDECA 2. BEDCA 3. BADEC 4. BAEDC 5.BDCEA

(17)

| | |
|---|---|
| මහා විජයබාහු රජු | A ලීලාවතී බිසව |
| මහා පරාක්‍රමබාහු රජු | B තිලෝකසුන්දරී බිසව |
| නිශ්ශංකමල්ල රජු | C රංගම්මා බිසව |
| පළවන විමලධර්මසූරිය | D කුසුමාසන දේවිය |
| ශ්‍රී වික්‍රම රාජසිංහ රජු | E කල්‍යාණවතී බිසව |

1. BDECA 2. BEDCA 3. BADEC 4. BAEDC 5.BDCEA

(18)

| | |
|---|---|
| වලිකාමම | A දෙවිනුවර |
| කම්මාරගාම | B වැලිගම |
| නීලවාලතිත්ථ | C යාපනය |
| සම්බලිතුරෙයි | D කඹුරුගමුව |
| දේවනගර | E මාතර |

1. BDECA 2. BEDCA 3. BADEC 4. BAEDC 5.BDCEA

(19)

| | |
|---|---|
| අනුරාධපුරය | A 1232-1287 |
| කෝට්ටේ | B ක්‍රි.පූ 3 වන සියවස-1017 |
| මහනුවර | C 1492-1815 |
| පොළොන්නරුව | D 1415-1492 |
| දඹදෙණිය | E 1070-1215 |

1. BDECA 2. BEDCA 3. BADEC 4. BAEDC 5.BDCEA

(20)

| | |
|---|---|
| හය වන පරාක්‍රමබාහු-සුනේත්‍රා දේවි | A සහෝදරයෝ |
| හත්වන බුවනෙකබාහු-ධර්මපාල | B පුතා හා මව |
| මායාදුන්නේ-පළවන රාජසිංහ | C ස්වාමිපුරුෂයා හා බිරිඳ |
| විදිය බණ්ඩාර-සමුද්‍රදේවිය | D පියා හා පුතා |
| පළවන විමලධර්මසූර්ය-සෙනරත් | E සීයා හා මුණුබුරා |

BDECA 2. BEDCA 3. BADEC 4. BAEDC 5.BDCEA

සපයා ඇති උපදෙස් සම්පිණ්ඩනය ඇසුරින් නිවැරදි පිළිතුර තෝරා වරහන තුළ සටහන් කරන්න

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| A හා B පමණක් නිවැරදිය | B හා C පමණක් නිවැරදිය | C හා D පමණක් නිවැරදිය | A හා C පමණක් නිවැරදිය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය |

(21) ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේද?

A දිවයිනේ සම්ප්‍රදායික ඉතිහාසය විජය පිළිබඳ පුරාවෘත්තයෙන් ආරම්භවේ
B විජයගේ අමාත්‍යවරු සිය නම් යොදා ජනාවාස පිහිටවූහ
C කුවේණි වෘත්තාන්තය පිළිබඳ දීපවංසයේ සවිස්තරාත්මකව දක්වා ඇත
D මදුරාපුර සිට පැමිණි කුමරිය පිළිබඳ තොරතුරු මහාවංසයේ දක්වා නැත

(22) වාරිමාර්ග පද්ධතියේ වර්ධනයට මහසෙන් රජුගේ දායකත්වය පිළිබඳ පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදිවේද?

A ඇළහැර ඇල හා යෝධ ඇළ ඉදිකිරීමේ ගෞරවය මහසෙන් රජුට හිමිවේ
B මහසෙන් රජු වැව් 11 හා ඇළමාර්ග 12 ක් තැනවීය
C මහසෙන් රජු විසින් කරවන ලද ඉතාමත් ප්‍රසිද්ධ වැව මින්නේරියයි.
D ඇළහැර මින්නේරි කවුඩුලු ව්‍යාපාරය සම්පූර්ණ කිරීමේ ගෞරවය මහසෙන් රජුට හිමිවේ

(23) චෝලයන් අනුරාධපුරයේ සිට පොළොන්නරුවට අගනගරය මාරුකිරීම සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේද?

A පොළොන්නරුව ඒ වන විට ද්‍රවිඩ ජනාවාසයක් බවට පත්ව තිබුණි
B මහවැලියෙන් පොළොන්නරුව ආරක්ෂාවිය
C රුහුණේකැරළිකාර ප්‍රදේශ පාලනය පහසු විය
D පොළොන්නරුව වඩාත් සුරක්ෂිත විය

(24) දෙවන රාජසිංහ රජු සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදිවේද?

A මොහු නායක්කර් වංශික පෙළපතට අයත්වූවෙකි
B පෘතුගීසීන් ලංකාවෙන් නෙරපා හැරීමට මොහු සමත් විය
C උඩරට රාජ්‍යයේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට කැපවූ රජෙකි
D උඩරට රාජ්‍යයට ඉංග්‍රීසීන්ගේ පැමිණීම සිදුවූයේ මොහුගේ කාලයේදීය

(25) කෝට්ටේ පෘතුගීසි බලය ස්ථාපිත වීම සම්බන්ධයෙන් කවර ප්‍රකාශ නිවැරදි වේද?

A පෘතුගීසීන් සතු උසස් හමුදා බලය
B පෘතුගීසීන් කෙරෙහි පළමුවන රාජසිංහ රජු දැක්වූ අනුකම්පාව.
C කෝට්ටේ පාලකයින්ගේ දුර්වලතා
D උඩරටියන්ගේ පක්ෂපාතී භාවය

පහත සඳහන් ප්‍රශ්න වල මාතෘකාවක් යටතේ ප්‍රකාශ පහ බැගින් දී ඇත. ඒ අතරින් එක් ප්‍රකාශයක් මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන ප්‍රකාශයේ අංකය වරහන තුළ ලියන්න

(26) නිශ්ශංකමල්ල රජු

1. පොළොන්නරු රාජධානියේ අවසාන බලවත් පාලකයාය
2 සෙල් ලිපි විශාල ප්‍රමාණයක් පිහිටුවිය
3 නිශ්ශංකලතා මණ්ඩපය හා තවත් ආගමික ගොඩනැගිලි රැසක් ඉදිකළේය
4. තුලාබාර දාන දෙමින් ජනතා සිත් දිනාගත්තේය.
5. 1215 දී කාලිංග මාඝ අතින් පරාජයට පත්විය.

(27) දඹදෙණි රාජධානිය

1. තුන්වන විජයබාහු රජු මෙම රාජධානියේ කීර්තිමත්ම පාලකයා විය.
2. පොළොන්නරුවේ සිටි මාඝ පළවාහැරීම මුල්ම දඹදෙණි රජවරුන්ට මුහුණදීමට සිදුවූ අභියෝගයක් විය.
3. දෙවන පරාක්‍රමබාහු රජු දඹදෙණි රාජ්‍යයට එල්ලවූ ජාවක ආක්‍රමණය මර්ධනය කළේය.
4. මේ සමයේ සාහිත්‍යයේ හා ආමික අංශයේ පුනර්ජීවනයක් ඇතිවිය.
5. වියළි කළාපයෙන් බැහැරව ගොඩනැගුණු පළමු රාජධානිය විය

(28) කෝට්ටේ නගරය

1. මෙම නගරය බිහිවීමට පදනම දැමුවේ නිශ්ශංක අලගක්කෝනාර විසිනි.
2. මුලදී කෝට්ටේ හැඳින්වූයේ දියසෙන්පුර යන නමිනි.
3. කෝට්ටේ නගරයේ වඩාත් සංවර්ධිත යුගය හය වන පරාක්‍රමබාහු යුගය ලෙස හැඳින්විය හැකිය.
4. 1551 පසු පෘතුගීසීහු කෝට්ටේ අභ්‍යන්තර දේශපාලන කටයුතු වලට මැදිහත් වූහ.
5. ධර්මපාල කුමරා විසින් කෝට්ටේ අයිතිය පෘතුගීසීන් වෙත පවරාදෙනු ලැබීය.

(29) පෘතුගීසි මිෂනාරි කටයුතු

1. 1505 දී පෘතුගීසීහු සිය මිෂනාරි ව්‍යාපාරය කෝට්ටේ රාජ්‍යයේ ආරම්භකළහ
2. පෘතුගීසීහු රෝමානු කතෝලික ධර්මය ප්‍රචාරය කළහ.
3. ගොන්සාල්වේස් පියතුමා කීර්තිමත් මිෂනාරි වරයෙකු විය.
4. අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවාව ඔවුන්ගේ ප්‍රධාන ප්‍රචාරක මාර්ගයක් විය.
5. උඩරට රාජ්‍යය තුළ ඉතා දුෂ්කර ලෙස මිෂනාරි ව්‍යාපාරය ගෙනයාමට පෘතුගීසීන්ට සිදුවිය.

(30) යාපන රාජ්‍යය

1. හයවන පරාක්‍රමබාහු රජු යාපනය තමන් යටතට ගත්තේය.
2. පෘතුගීසීහු පැමිණෙන විට යාපනය ස්වාධීන රාජ්‍යයක් විය.
3. දකුණු ඉන්දියාවෙන් පැමිණි නායක්කර් වංශය යාපනය පාලනය කළහ.
4. සංකිලිගේ පාලන සමයේදී පෘතුගීසීන් හා යාපන පාලකයන් අතර ගැටුම් ඇතිවිය.
5. 1619 දී පෘතුගීසීහු යාපනය අල්ලාගත්හ.

නිවැරදි පිළිතුර තෝරා ඊට අදාල අංකය වරහන තුළ සටහන් කරන්න

(31) කෝට්ටේ යුගයේ ප්‍රකට අධ්‍යාපන මධ්‍යස්ථානයක් වූයේ මින් කුමක්ද?

1. ආලාහන පිරිවෙන
2. පද්මාවතී පිරිවෙන
3. විද්‍යාලංකාර පිරිවෙන
4. දික්සඳ සේනාපති පිරිවෙන
5. උත්තරමූල පිරිවෙන

(32) පළවන විජයබාහු රජු විසින් ඉදිකරන ලද ආගමික ගොඩනැගිල්ලක් වූයේ

1. සත්මහල්ප්‍රාසාදය
2. හැටදාගෙය
3. රත්කොත්වෙහෙර
4. වටදාගෙය
5. ලංකාතිලක විහාරය

(33) ලංකාවද දළදාව රැගෙන එන ලද්දේ කුමන රාජ්‍ය සමයේද?

1. වංකනාසිකතිස්ස රාජය සමයේ
2. ගජබාහු රාජ්‍ය සමයේ
3. වළගම්බා රාජ්‍ය සමයේ
4. කිත්සිරිමෙවන් රාජ්‍ය සමයේ
5. සද්ධාතිස්ස රාජ්‍ය සමයේ

(34) මහසෙන් රජු විසින් ඉදිකරන ලද ආගමික ගොඩනැගිල්ලක් වන්නේ

1. ජේතවනාරාමය
2. අභයගිරිය
3. ආලාහන පිරිවෙන
4. ලංකාරාමය
5. අම්බස්තල චෛතයය

(35) පෘතුගීසි බලය මෙරට මුල්බැසගැනීම වැළැක්වීමට උත්සහ ගත් පාලකයෙකු වන්නේ

1. නව වන ධර්ම පරාක්‍රමබාහු
2. හත්වන විජයබාහු
3. මායාදුන්නේ
4. දෙවන රාජසිංහ
5. කරලියැද්දේ බණ්ඩාර

29-03-2018
13 ශ්‍රේණිය
ඉතිහාසය

අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා ප්‍රකාශ යුගළ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට වඩාත්ම ගැළපෙන ප්‍රකාශ යුගළය වගුව තුළින් තෝරා ඊට අදාල අංකය වරහන තුළ ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | වැරදිය |
| 2 | නිවැරදිය | නිවැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

| | | | |
|---|---|---|---|
| 36 | රටේ සියලු භූමිය රජුට අයත් බව මෙරට පිළිගත් සම්මතය විය. | සම්ප්‍රදායික නීතිරීති හා සංස්ථා ආරක්ෂා කිරීම රජු විසින් කළ යුතු කාර්යයක් ලෙස සළකනු ලැබිය. | |
| 37 | කාලිංග මාඝගේ ආක්‍රමණය නිසා රජරට ශිෂ්ඨාචාරය බිඳවැටුනි. | මාඝ රජ රට අල්ලාගෙන පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය කර ගත්තේය. | |
| 38 | 1521 විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ, සීතාවක හි රයිගම රාජ්‍ය බිහි විය | 1521 දී සීතාවක රාජයයේ පාලකයා වශයෙන් පළවන රාජසිංහ රජු පත්විය. | |
| 39 | යාපහුව අතීතයේදී සුභ පබ්බත යන නමින් හඳුන්වනු ලැබීය. | ආරක්ෂිත අගනුවරක් ලෙසින් හැඳින්විය හැකි යාපහුවේ රාජ මාළිගය, ද්වාර මණ්ඩපය, ගල් පඩිපෙළ ආදියෙන් සමන්විතවූ ගොඩනැගිලි සංකීර්ණයක් දැකගත හැකිය. | |
| 40 | ගම්පොළ යුගයේ ගෘහ නිර්මාණ තුළ දකුණු ඉන්දිය ගෘහ නිර්මාණශිල්පීය ලක්ෂණ දක්නට ඇත. | පිරිවෙන් තුළින් සිදුවූ ශාස්ත්‍රීය සේවය හේතු කොටගෙන කෝට්ටේ සමයේ සාහිතයයේ පිබිදීමක් ඇති විය. | |

Learning Resource Center
R
De Mazenod College
Kand

29 - 03 - 2018
13 ශ්‍රේණිය .


ද මැසිනොද් විදුහල කඳාන
De Mazenod College - Kandana


# ඉතිහාසය -I

පැය 3

දෙවන වාර පරීක්ෂණය 2018 මාර්තු

13 වන ශ්‍රේණිය ඉතිහාසය I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය-අතීතයේ සිට ක්‍රි. ව. 1978 දක්වා (25 S-I)
පළමුවන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට ඒවායින් කැමති ස්ථාන දෙකක් පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. ගාල්ල | 2. යාපනය | 3. වළවේ ගඟ | 4. රයිගම |
| 5. මහනුවර | 6. පරාක්‍රම සමුද්‍රය | 7. කොට්ටියාරම | 8. හලාවත |

2. දහතුන් වන සියවස අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි භූගෝලීය සාධක බලපෑ ආකාරය පහත සඳහන් මාතෘකා ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.
   1. ඉන්දියාව ආසන්නයේ පිහිටීම
   2. ගංගා වල වැදගත්කම (ලකුණු 7 බැගින්)

3. වළගම්බා සහ පළමුවන විජයබාහු යන රජවරුන් තම දේශපාලන බලය පිහිටුවා ගැනීමේදී මුහුණදුන් අභියෝග සංසන්දනය කරන්න. (ලකුණු 14)

4. අනුරාධපුර යුගයේ වාරිමාර්ග පද්ධතියේ ක්‍රමික වර්ධනය පහත දැක්වෙන ක්ෂේත්‍ර ඇසුරින් පරීක්ෂා කරන්න
   1. වැව් හා ඇමාර්ග පද්ධතිය
   2. වාරි තාක්ෂණය (ලකුණු 14)

5. පහත සඳහන් මාතෘකාවන් ගෙන් දෙකක් පිළිබඳව විචාරාත්මකව විමසන්න
   1. ධාතුසේන රජුගේ පාලන සමයේ වාරිමාර්ග ක්‍රමයේ වර්ධනය
   2. දෙවන පරාක්‍රමබාහු රජුගේ පාලන සමයේ වැදගත්කම
   3. සීතාවක රාජ්‍යයේ බල වර්ධනය (ලකුණු 7 බැගින්)

6. 1. හය වන පරාක්‍රමබාහු රජු සිය ප්‍රථම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරාගත් ප්‍රදේශය නම් කරන්න (ලකුණු 1)
   2. කෝට්ටේ යුගයේ විසූ උගතුන් දෙදෙනෙකු නම් කරන්න (ලකුණු 2)
   3. කෝට්ටේ යුගයේ සාහිත්‍යයේ වර්ධනය කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 4)
   4. හය වන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරන්න (ලකුණු 7)

7. 1. විජයබා කොල්ලය මෙහෙයවූ කුමාරවරුන් තිදෙනා නම් කරන්න (ලකුණු 2)
   2. මෙරටට පැමිණි මුල් පෘතුගීසි කණ්ඩායම් මෙරට සිය බලය ව්‍යාප්ත කර ගැනීමට උත්සය කළේ ඇයිදැයි පහදන්න (ලකුණු 5)
   3. කෝට්ටේ රාජයය තුළ පෘතුගීසි බල වර්ධනයට හේතු උදාහරණ සහිතව පහදන්න (ලකුණු 7)

Learning Resource Center R De Mazenod College Kandana

2 . 04 . 2018
13 ශ්‍රේණිය

Learning Resource Ce
R
De Mazenod College
Kandana

ඉතිහාසය II

යුරෝපා ඉතිහාසය- (25 S-I) කාලය පැය 2

මෙම කොටස ප්‍රශ්න 7 කින් සමන්විත වේ. පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

(1) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඉන් ස්ථාන දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න

1. රෝමය 2. ඇතැන්ස් 3. බෝල්ටික් මුහුද 4. ප්‍රංශය
5. රයින් ගග 6. ලිස්බන් 7. පිරනීස් 8. ලිවර්පූල්

(2) 1. ග්‍රීක පෞර රාජ්‍ය දෙකක් නම් කරන්න (ලකුණු 2)
2. පෞර රාජ්‍ය තුළ දක්නට ලැබුණු ග්‍රීක දර්ශනය පිළිබඳව විස්තර කරන්න (ලකුණු 5)
3. ග්‍රීක රාජ්‍ය වල දක්නට ලැබුණු ආණ්ඩුක්‍රම පිළිබඳව විස්තර කරන්න (ලකුණු 7)

(3) 1. මධ්‍යතන යුරෝපයේ පැවති වැඩවසම් ක්‍රමයේ මූලික ලක්ෂණ මොනවාද? (ලකුණු 7)
2. එම ක්‍රමය පරිහානියට පත්වීමට බලපෑ හේතු පැහැදිලි කරන්න (ලකුණු 7)

(4) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය මුල්කොටගෙන බටහිර යුරෝපයේ පැවති ආගමික එක්සත්භාවය බිඳ වැටුණි.
1. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ප්‍රධාන නායකයින් දෙදෙනෙකු නම් කරන්න (ලකුණු 2)
2. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ජර්මනියෙන් ආරම්භවූයේ මන්දැයි පහදන්න. (ලකුණු 3)
3. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ඇතිවීමට තුඩුදුන් සාධක කෙටියෙන් දක්වන්න (ලකුණු 4)
4. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න (ලකුණු 5)

(5) "ප්‍රංශ විප්ලවය ඇතිකළේ මධ්‍යම පන්තියයි" විප්ලවයට හේතුවූ කරුණු දක්වමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න (ලකුණු 14)

(6) " යුරෝපයේ පැවති ආගමික ගැටළු වලට ස්ථිර විසඳුමක් ලබා දීමට තිස් අවුරුදු යුද්ධයට හැකි විය." තිස් අවුරුදු යුද්ධයට හේතුවූ කරුණු හා එහි අවස්ථා දක්වමින් මෙම ප්‍රකාශය විමසන්න (ලකුණු 14)

(7) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න
1. රෝම නීතිය
2. මානුෂවාදය
3. ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරයේ ප්‍රධාන අංග
4. හතරවන හෙන්රි රජුගේ පාලනය
5. එංගලන්තයේ ටියුඩර් යුගය (ලකුණු 7x2)

3194

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

Department of Examinations, Sri Lanka

ඉතිහාසය II
வரலாறு II
History II

**25-B**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2003 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2003 ஏப்ரல்
**General Certificate of Education (Adv. Level) Examination, April 2003**

ප්‍රශ්න අංකය
வினா இல
**Question No.** 10

විභාග අංකය
சுட்டெண்
**Index No.** ..............................

